**<u>කොළඹදී පවත්වනු ලබන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන )</u>**

**<u>බස්නාහිර පළාත්බඳ මහාධිකරණයේදීය.</u>**

**<u>මහාධිකරණ විනිසුරු ගාමිණී අමරසේකර මැතිතුමා ඉදිරිපිටදී ය.</u>**

සටහන් කලේ: ල/ලේ, එම්.කේ.ටී.එල්.දිල්රුක්ෂි.

යොෂියුකි හයාෂි සහ තවත් අයෙක්

පැමිණිලිකරුවන්

- එදිරිව-

1. ඩිලන්ත රන්ජුල බණ්ඩාර මාලගමුව සහ තවත් නව දෙනෙක්

විත්තිකරුවන්

<u>නඩු අංකය : H.C /civil/47/2011/CO</u>

<u>දිනය : 2013.03.15</u>

## නි යෝ ග ය.

මෙම නඩුවේ පැමිණිලිකරු තම පැමිණිල්ලේදී අතුරු නියෝග කිපයක් අයැද ඇත. ඉන් අතුරු නියෝග සමහරක් මුල් අවස්ථාවේදී ලබා ගෙනද ඇත. පැමිණිලිකරුගේ පෙත්සමට වගඋත්තරකරුවන් විරෝධතා බැදීමෙන් පසු පාර්ශ්ව විසින් ලිඛිත දේශන බැදීමෙන් පසු මෙම නියෝගය නියමිතය.

මුල් අවස්ථාවේ අයැදීම් f(ii), (iii), (iv) අතුරු නියෝග නිකුත් කර ඇතත් අයැදීම් f(i), (v) යටතේ අතුරු ආඥා අයැදීමේ නොතිසි පමණක් නිකුත් කර ඇත. කෙසේ වෙතත් විරෝධතා බැදීම් වලදී ප්‍රධාන පෙත්සමට විරෝධතා මිස දැනට නිකුත් කර ඇති අතුරු නියෝගය ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස ( නඩුව ගෙන යා නොහැකි වන බවට 1 සිට 4 වගඋත්තරකරුවන් ගෙන එන මූලික විරෝධය පැම පසුව සලකනු ඇත.) සමාගම් පනතේ 521 වගන්තිය යටතේ කිසිදු වගඋත්තරකාර පාර්ශ්වයක් ඉල්ලීම් කර නැති බව පෙනේ. ( බලන්න 8 වගඋත්තරකරුගේ විරෝධතා පෙත්සමේ අයැදීම්, 7 වන වගඋත්තරකරුගේ විරෝධතා පෙත්සමේ අයැදීම්, 1- 4 වගඋත්තරකරුවන්ගේ විරෝධතා පෙත්සමේ අයැදීම්, 10 වන වගඋත්තරකරුගේ පෙත්සමේ අයැදීම්, 9 වන වගඋත්තරකරුගේ

විරෝධතා පෙත්සමේ අයැදීම් ). මේ අනුව 1 - 4 වගඋත්තරකරුවන් නගන මූලික විරෝධතා පිළිගෙන නඩුව ඉවතලන තත්ත්වයක් ඇති නොවුන හොත් දැනට ඒකපාක්ෂිකව ලැබී ඇති අතුරු නියෝග ඉවතලීම හෝ වෙනස් කිරීම සඳහා සමාගම් පනතේ 521 වගන්තිය යටතේ ඒවා ඉවතලීමට හෝ වෙනස් කිරීමට ඉල්ලීම් කිරීමක් නොමැති බව ප්‍රථමයෙන් සඳහන් කරමි.

1 - 4 වගඋත්තරකරුවන් පමණක් තම මූලික විරෝධය තහවුරු කිරීම සඳහා ලිඛිත දේශන ගොනු කර ඇති අතර අනෙකුත් වගඋත්තරකරුවන් ලිඛිත දේශන ගොනු කිරීමක් කර නැත. පෙත්සම්කරු මුලින් අතුරු නියෝග අයැදීම් සම්බන්ධයෙන්ද, පසුව මූලික විරෝධතා අරබයාද ලිඛිත දේශන ගොනු කර ඇත. 2012.02.24 දාතම කාර්ය සටහන් අංක 09 හිදී මූලික විරෝධතා හා අතුරු නියෝග අයැදීම් මුල්කර ලිඛිත දේශන ගොනු කරන ලෙස අධිකරණය දන්වා ඇත. 2012.12.21 දින යතුරු ලිඛිත සටහන් වලදී, මූලික විරෝධතා නගන පාර්ශ්වය ඒ සම්බන්ධව පමණක්ද පෙත්සම්කරු අතුරු නියෝග ඉල්ලීම් අරබයා පමණක්ද ලිඛිත දේශන ගොනු කර තිබීම මත ඒ ගැන අධිකරණයේ අවධානය යොමු වී තිබී පාර්ශ්වයන්ට දැන්වීමෙන් පසු මූලික විරෝධතා නැඟී පාර්ශ්වය ඒ මත පමණක් විශ්වාසය තබන බව දන්වා ඇත. ඒ අනුව මූලික විරෝධය ප්‍රතික්ෂේප වුවහොත් ඉල්ලා ඇති නමුත් ලබා දී නැති අතුරු නියෝග ලබා දීම, දැනටමත් ලබා දී ඇති අතුරු නියෝග ඉවත් කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳව ලිඛිත දේශන මගින් හෝ කරුණු කීමක් ඒ අනුව ඔවුන් කර නැත.

පෙත්සම්කරු 2012.12.21 අධිකරණය විසින් යතුරු ලිඛිත සටහන් වලදී අවධානය යොමු කිරීමෙන් පසු මූලික විරෝධය මුල් කර ද ලිඛිත දේශන මගින් කරුණු කියා ඇත.

මේ අනුව 1- 4 වගඋත්තරකරුවන් නගන මූලික විරෝධය ප්‍රථමයෙන් සලකමි.

පෙත්සම්කරුවන් තම පෙත්සමේ ඉදිරිපත් කරන්නේ ' 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සහ ඒ ප්‍රකාර වූ ඉල්ලීමක කාරණයේදී ය ' ලෙස සිරසෙහි සඳහන් කරමින් ය. නමුත් ඒ සමාගම් පනතේ කුමන වගන්තියක් හෝ වගන්ති ඇසුරින් කරන ඉල්ලීමක්දැයි එහි සඳහන් කර නැත. 1- 4 වගඋත්තරකරුවන්ගේ මූලික විරෝධය පැම වන්නේ 1996 අංක 10 පනතේ 2 වගන්තිය හා අනුරූප 1 හි උපලේඛනය 2007 අංක 7 සමාගම් පනතේ 534 වගන්තිය අනුව සංශෝධනය වී ඇති පරිදි සලකන විට , සමාගම් පනතේ 529 වගන්තියද සලකන කල මෙම අධිකරණයට බලය ඇත්තේ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සියළු ඉල්ලීම් හා නඩු කටයුතු සඳහා බවය. එමෙන්ම 2007 අංක 7 දරණ සමාගම් පනතේ 520 වගන්තිය එම ඉල්ලීම් යොමු කිරීම් කරන ආකාරය දක්වා තිබීම කෙරෙහිද අවධානය යොමු කර ඇත. ඒ වගන්තිය අනුව සමාගම් <u>පනතේ විධි විධාන යටතේ</u> සෑම ඉල්ලීමක්ම, යොමු කිරීමක්ම පෙත්සමකින් හා දිවුරුම් ප්‍රකාශයකින් ( වෙනත් ආකාරයකට විධි විධාන යොදා ඇති හෝ

අධිකරණය විධාන නොකරන විටක ) විය යුතු බව කියා ඇත. ඒ අනුව මෙම අධිකරණයේ නඩු පැවරිය හැක්කේ සමාගම් පනතේ විධි විධාන තුලින් කරන ඉල්ලීම් හෝ යොමු කිරීම් මත පමණක් බව 1- 4 වගඋත්තරකරුවන්ගේ තර්කය වේ.

පෙත්සම්කරු වෙනුවෙන් අදාල 534 වගන්ති යේදී ' සියළු ඉල්ලීම් සහ නඩු කටයුතු 'ලෙස සඳහන් වීම නිසා සමාගම් ඇසුරෙන් වන ඕනෑම නඩුවක් මෙම අධිකරණයේ පැවරිය හැකි ලෙස අර්ථනිරූපනය කල යුතු බව කියන බව පෙනේ. නමුත් 'නඩු කටයුත්තක් ' ඉල්ලීමක් හෝ යොමු කිරීමක් නොමැතිව ඇරඹෙනු නැත. නඩුව ආරම්භ වීම සඳහා 520 වගන්තියේදී සමාගම් පනතේ විධිවිධාන යටතේ සෑම ඉල්ලීමක් හෝ යොමු කිරීමක් ගැන අවධානය යොමු කර කාර්ය පටිපාටිය දැක්වෙන්නේ අධිකරණයේ නඩු පැවරීම සඳහා ඉල්ලීමක් හෝ යොමු කිරීමක් කිරීමට විධි විධාන සලසන වගන්තියක අවශ්‍යතාව අගවන බව මාගේ මතයයි. අන්තර් කාලීන විධි විධාන වල ( 530(3) වගන්තිය )දී දිසා අධිකරණය වන සියළු නඩු කටයුතු මෙම අධිකරණයට යොමු කිරීමට ඇති විධි විධානයටද පෙත්සම්කරු වෙනුවෙන් අවධානය යොමු කර ඇත. එහි සියළු නඩු කටයුතු ලෙස මිස සමාගම් වලට අදාල සියළු නඩු කටයුතු ලෙස හෝ සඳහන්ව නැත. නමුත් ඉන් දිසා අධිකරණයේ සියළු නඩු කටයුතු( සමාගම් වලට අදාල නොවන වුවා) හෝ සමාගම් වලට අදාල සියළු නඩු කටයුතු හෝ යන්න නොව, සමාගම් පනතේ සමස්ථය සලකන කල නව සමාගම් පනතින් මෙම

අධිකරණයට බලය පවරා ඇති නඩු වලට සමානුරූපී සියළු නඩු අදහස් කරන බව මාගේ මතයයි. මේ අනුව විරෝධයේ පදනම පිළිගෙන හැකි වේ. එලෙස ඉල්ලීම් හෝ යොමු කිරීම් කල හැකි විධි විධාන 48 ක් ඇති බවට 1-4 වගඋත්තරකරුවන් වෙනුවෙන් අවධානය යොමු කර ඇත. එය සම්පූර්ණ ද අසම්පූර්ණ ද යන්න පරීක්ෂා කිරීම මෙම අවස්ථාවේදී පැන නොනගී.

සමාගම් පනතේ විධිවිධානයකින් මෙම අධිකරණයේ නඩු පැවරීමට ඉඩකඩ නොසලසා ඇතිවිට අනෙක් නඩු සියල්ල දිසා අධිකරණයට යා යුතු බවට 1-4 වගඋත්තරකරුවන් වෙනුවෙන් තර්ක කරන බව පෙනේ. නමුත් සෑම විටම එසේ වීම අවශ්‍ය නොවීමටද ඉඩ ඇත. උදාරහරණ ලෙස සමාගම් පනත යටතේ ඉඩ දෙන ඉල්ලීමකට ආනුෂංගික සහනයක් ලෙස, ප්‍රතිකර්ම ලෙස සමහර කාරණා අයැදීමට ඉඩ ලැබිය හැකිය. උදාහරණ ලෙස පීඩාව හෝ අයථා කළමණාකරණය තුල අධ්‍යක්ෂකවරයකු ලෙස සිටි අයකු නෙරපනු ලැබුවේ නම් පීඩාව හා අයථා කළමණාකරණය තුල ගෙන එන නඩුවකදී සහනයක් ලෙස පීඩාව ඉවත් කිරීම හෝ යථා කළමණාකරණය සඳහා අධ්‍යක්ෂක ලෙස ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටීමට හා නැවත තනතුරේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමට නොහැකියාවක් නැත. නමුත් මූලික සහනය හා නඩු නිමිත්ත සඳහා සහන ඉල්ලීම සමාගම් පනතේ ඉල්ලීමක් කිරීම සඳහා ඉඩකඩ සලසා ඇති වගන්තියක් තුලින් විය යුතුය. අනෙකුත් සහනය ඊට ආනුෂංගික විය යුතුය. සමාගම් පනතේ ඉඩකඩ සලසන වගන්තියක් අවශ්‍ය නැති බවත්, ඕනෑම සමාගමකට අදාල නඩු කටයුත්තට

අදාල නඩු පැවරිය හැකි ලෙස පුළුල්ව සැලකීමට ගියහොත් වියවුල් සහගත තත්ත්වයක් ඇති විය හැකිය. උදාහරණ ලෙස ව්‍යුත්පන්න නඩුකරයකට (234 වගන්තියට) ඇති සීමා නොතකා නඩු පවරා සමාගමකට අදාල නිසා විමසීමට බලය ඇතැයි තර්ක කිරීමට හැකි වනු ඇත.

මේ අනුව පෙත්සම්කරුගේ මුල් පෙත්සමේ c, e, f අයැදීම් සමාගම් පනතේ විධි විධාන තුළින් වන අයැදීම් නොවන බවත් , ඒවා සමාගම් පනතේ වගන්ති තුලින් පැන නගින බව පෙන්වා නැති බවත් , සමාගම් පනතේ 520 වගන්තිය යටතේ ගොනු කරන ප්‍රධාන ඉල්ලීමක් නොමැති විට 521 වගන්තිය යටතේ අතුරු නියෝග ඉල්ලීම් කල නොහැකි බවත් 1- 4 විත්තිකරුවන් වෙනුවෙන් මූලික විරෝධයේදී දක්වා ඇත. 520 වගන්තිය යටතේ ප්‍රධාන ඉල්ලීමක් නැති විට 521 යටතේ අතුරු නියෝග ලබා ගත නොහැකි යන්න නිවැරදි තර්කයක් වන්නේ 521 වගන්තියේදී අතුරු නියෝග කිරීමට අවස්ථාව ලබා දෙන්නේ සමාගම් පනත යටතේ අධිකරණය වෙත කරනු ලැබූ යම් ඉල්ලීමකදී හෝ යොමු කිරීමකදී අවසන් ආඥාව කරන තුරු බැවිනි. කෙසේ වෙතත් ඉහත f අයැද ඇත්තේ අතුරු නියෝග ලෙස වේ. පෙත්සම්කරු වෙනුවෙන් ඔහු අයැදින අතුරු නියෝග වලට සමාන ආකාරයේ අතුරු නියෝග සඳහා අයැදීම් සහිත මෙම අධිකරණයේ ගොනු වී ඇති හෝ තිබූ නඩු කීපයක් පෙත්සමේ මූලික විරෝධයට පිළිතුරු ලෙස ලිඛිත දේශන සමග ගොනු කර ඇත. ලිඛිත දේශන සමග ගොනු කරන ලේඛන සාක්ෂි ලෙස සැලකීම සුදුසු නොවුවත් එම ලේඛන සැලකුවේ වුවද

එකී පෙත්සම් පෙන්වන්නේ එකී අතුරු නියෝග අයැද ඇත්තේ සමාගම් පනතේ වගන්ති යටතේ ප්‍රධාන ඉල්ලීම් කල (224, 225 වගන්ති යටතේ වැනි) පෙත්සම් වල අතුරු සහන ලෙස බවය. ඒ අනුව, එකී ලේඛන තුලින් මූලික විරෝධයක් ලෙස 1 - 4 වගඋත්තරකරුවන් නගන තර්කය නිෂ්ප්‍රභ වන්නේ නැත. 1- 4 වගඋත්තරකරුවන් පෙන්නා දෙන ලෙසට පෙත්සම්කරුගේ පෙත්සමේ e යන ප්‍රධාන අයැදීම් සමාගම් පනතේ යම් නිශ්චිත විධි විධානයක් යටතේ ඉල්ලීම් බවට පෙනී යන්නේ හෝ පෙන්නා සිට නැත. එය කොටස් ලේඛන නිවැරදි කිරීමට සෘජුව ආනුෂංගික වන ඉල්ලීමක් වන බව පෙනී යන්නේ ද නැත. කෙසේ වෙතත් පෙත්සම්කරුගේ පෙත්සමේ b හා d අයැදීම් කොටස් රෙජිස්ටරය නිවැරදි කිරීමේ ඉල්ලීම් නිසා විශේෂිතව සඳහන් කර නැතත් ඒවා සමාගම් පනතේ 128 වගන්තිය යටතේ ඉල්ලීම් බව පැහැදිලිය . C අයැදීමද B හා D අයැදීම් වල සහන ලබා දීමට ආනුෂංගික වන ප්‍රකාශනාත්මක සහනයක් අයැදීමක් පමණි. එය මෙම අධිකරණයට බලය ඇති B හා D සහන ලබා දීමට මුල් වන නීතිමය තත්ත්වය ප්‍රකාශ කරවා ගැනීමට අයදින ආනුෂංගික සහනයන් පමණි. ඒ අනුව c, b හා d මත ඊට පාදක කරුණු ඔප්පු කිරීමේ කාරණයට යටත්ව මෙම අධිකරණයේ ගොනුකල හැකි අයැදීම් වේ .

මේ අනුව පෙත්සමේ සහන අයැදීම් අතර හා ඊට පාදක වන නිමිති අතර e අයැදීම නිසා දුප්බන්ධනයක් පවතින බව පිළිගත යුතුය. මෙම දුප්බන්ධිත තත්ත්වය නිසා පෙත්සම මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා කරන ලෙස

1- 4 වගඋත්තරකරුවන් වෙනුවෙන් කරුණු කියා ඇත. නමුත් නඩු නිමිති හෝ සහන අයැදීම් වල දුර්බන්ධනයක් නිසා නඩු නිෂ්ප්‍රභා කිරීම කල යුතුව නැත. පෙත්සම්කරුට මෙම අධිකරණයට අදාල සහන පමණක් දක්වන ලෙස පෙත්සම සංශෝධනය කිරීමට අවස්ථාව දීමෙන් එය නිරවුල් කරගත හැකි වේ. මේ අනුව මූලික විරෝධය යම් දුරකට පිළිගත්තද පෙත්සම එනයින්ම නිෂ්ප්‍රභා නො කරමි. මෙම අධිකරණයට බලය ඇති ප්‍රධාන ඉල්ලීම වන කොටසේ ලැයිස්තුව සංශෝධනයට ඉල්ලීම් ඊට ආනුෂංගික සහන සහිත වන ලෙස c, b හා d අයැදීම් සහිතව පෙත්සම සංශෝධනය කර ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට අවස්ථාව දීමෙන් එකී ඌනතාව නිවැරදි කල හැකි වේ. මේ අනුව මූලික විරෝධය මත පෙත්සම එනයින්ම නිෂ්ප්‍රභා නොකරමි. සංශෝධනය කිරීමට අවස්ථාව දෙමි. පෙත්සම නිෂ්ප්‍රභා නොකරන නිසා නිකුත් කර ඇති අතුරු නියෝග ඉවත් කිරීමට 521 වගන්තිය යටතේ ඉල්ලීම් කර නැති නිසා දැනට කර ඇති අතුරු නියෝගය ඉවත් කිරීම හෝ සංශෝධනය කිරීම නො කරමි. නමුත් පෙත්සම සංශෝධනය කිරීම මත හෝ වෙනත් ප්‍රස්තුත කරුණු මත කර ඇති අතුරු නියෝග ඉවත් කිරීමට ඉල්ලීම් කිරීමේ අයිතිය ඉතිරි කරමි. කෙසේ වෙතත් පෙත්සම සංශෝධනය කිරීමට අවස්ථාව දෙන නිසා එය කරන තුරු අනෙකුත් ඉල්ලා ඇති අතුරු නියෝග සැලකීම සුදුසු නොවනු ඇත. මන්ද පෙත්සම සංශෝධනය කල විට ඉල්ලන අතුරු නියෝග සංශෝධිත පෙත්සමේ ප්‍රධාන සහන සුරැකීමට ලබා දිය යුතුද නැතිද යන්න සැලකීම වඩා සුදුසු වන හෙයිනි. අතුරු සහන මුල් කර නිරවුල්ව විරෝධතා බැඳීමට හැකි වන්නේ ද එවිට බැවිනි.

ඒ අනුව පෙත්සම සංශෝධනයට අවස්ථාව දෙමි. මෙම අවස්ථාවේදී ඉතිරි අතුරු නියෝග ඉල්ලීම් නො සලකා පෙත්සම සංශෝධනයෙන් පසු සැලකීමට තබමි.

( ගාමිණී අමරසේකර )

මහාධිකරණ විනිසුරු

කොළඹ.

2013.03.15